මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov.@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීපීසී/පීඑස්සී/9/1/1/විගණන<br>දෙපා(ස්.මා) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.08. 23 |

මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>පළාත් විගණන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ශක්තිමත් කිරීමේ සාකච්ඡාව අනුව දිස්ත්‍රික් විගණන කාර්යාල වලට නිලධාරීන් අනුයුක්ත කිරීම. (දින දීර්ඝ කිරීම)</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.06.23 දිනැති ලිපිය හා බැඳේ.

02. මධ්‍යම පළාත් විගණන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 13 න් මේ වන විට තනතුරු 05 ක් පුරප්පාඩුව පවතින අතර, එම තනතුරු ඒ ඒ දිස්ත්‍රික් විගණන කාර්යාල සඳහා පහත පරිදි වේ.

- මහනුවර දිස්ත්‍රික් කාර්යාලය - පුරප්පාඩු 01
- මාතලේ දිස්ත්‍රික් කාර්යාලය - පුරප්පාඩු 02
- නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය - පුරප්පාඩු 02

03. මධ්‍යම පළාත තුළ විගණන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා දැනට මධ්‍යම පළාත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් අතුරින් ස්ථාන මාරු පදනම මත පහත පරිදි මධ්‍යම පළාත් කළමනාකරණ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ඉහත සඳහන් දිස්ත්‍රික් 03 ට අදාලව විගණන දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු අයැදුම්පත් කැඳවීමට තීරණය කර ඇත. (අනුප්‍රාප්තිකයකු රහිතව/ අනුප්‍රාප්තිකයෙකු පසුව ලබා දීමේ පදනම මත අදාල නිලධාරියා ස්ථාන මාරු කිරීමට එකඟතාවය පළ කළ හැකිනම් වඩාත් කාලෝචිතවේ)

<u>සුදුසුකම්</u>

- කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාල ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයන්හි පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම
- ස්ථාන මාරු ලැබීමෙන් පසු ඉදිරි සේවා කාලය අවම වශයෙන් වසර 05 ක් වත් තිබීම.
- ඉහත දිස්ත්‍රික් කාර්යාලයන්හි සේවයට පැමිණීමට හැකි පරිදි ආසන්න පදිංචිය.
- විගණන හා විනය චෝදනාවලට ලක් නොවූ අයෙකු වීම.

04. ඒ අනුව මගේ සමාංක හා 2022.06.23 දිනැති ලිපියෙහි 04 වන ඡේදයේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ දිනය 2022.07.20 වන අතර, එය 2022.09.09 දින දක්වා දින දීර්ඝ කර ඇති බව කාරුණිකව දන්වන අතර, මධ්‍යම පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන මධ්‍යම පළාත් කළමනාකරණ සේවයේ නිලධාරීන් අදාල ස්ථාන මාරු අයැදුම්පත සම්පූර්ණ කර අදාළ නිර්දේශ සහිතව <u>2022.09.09</u> දිනට ප්‍රථම මෙම කාර්යාලය වෙත ලැබීමට සලස්වන මෙන් වැඩිදුරටත් දන්වමි.

05. තවද, පුරප්පාඩු ප්‍රමාණයට වඩා අයදුම්පත් ඉදිරිපත් වුවහොත් තෝරාගැනීමේ ක්‍රමවේදයක් මඟින් ඉදිරි කටයුතු සිදුකරන බව වැඩිදුරටත් දන්වමි.

ටී.ඒ.ඩී.ඩබ්. දයානන්ද
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව